# ගුවන්විදුලියෙහි මාධ්‍යමය ප්‍රබලතාවන් සංවර්ධනාත්මක සන්නිවේදනයෙහි ලා භාවිතකිරීම පිළිබඳ විමසුමක්

සේන නානායක්කාර

මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

*senananayakkara@gmail.com*

## Evaluation of the use of Radio in Development Communication Process

**Sena Nanayakkara**

**Abstract:**

The radio media has passed more than nine decades after it was introduced to the world and by now it has become a very popular media among the public. But, currently it has shown a minor decline in its popularity due to the arrival of new media such as visual technology. Another reason for this decline is that radio broadcasting is an auditory communication system which depends only on sounds. But the experts accept that, radio media consists of very powerful potentials to change social, economic, political and cultural situations of the society. This study, therefore, is an important and a fruitful investigation targeting the social development, because the main objective of this study is to examine the communicative contribution played by the radio based on the said potentials in respect of the development communication process.

The methodology adopted in this study is mainly based on the literature survey of contemporary archives on the print media in respect of history of sound broadcasting. Further, the study has investigated many kinds of strengths of the media through listening to radio programs.

This study identified and concluded that the radio media has very extensive feasibilities in respect of development communication. In this connection, promptness, multiplicity, transgression of social varieties, simple technology and flexibility, ability of expansion of imagination, consequential profitability and attractive communication patterns play a major role. The most significant fact revealed by this study is that radio is the most usable instrument for the development communication process in developing countries.

**පර්යේෂණ සංක්ෂිප්තය**

ගුවන්විදුලිය මාධ්‍ය ලෝකයට හඳුන්වා දී මේ වන විට දසක නවයකට වැඩි කලක් ගතවී ඇති අතර, එය ජනතාව අතර වඩාත් ජනප්‍රිය මාධ්‍යයක් බවට පත්ව ඇති නමුත්, අද්‍යතන රූපමාධ්‍යයේ නව සංක්‍රමණය හේතුකොට ගෙන එහි ජනප්‍රියතාවයේ මඳ අවගමනයක් පෙන්නුම් කෙරේ. ගුවන්විදුලිය හඬ පමණක් මුල්කොටගත් ශ්‍රැතගෝචර මාධ්‍යයක් වීම ඒ සඳහා වූ විළඟ සාධකයයි. එසේවුවද එය සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික ආස්ථානයන් වෙනස් කළ හැකි ශක්‍යතා සහිත, වඩාත් බලපෑම්සහගත මාධ්‍යයක් ලෙස විශේෂඥයෝ පිළිගනිති. එබැවින්, මෙම අධ්‍යයනය සමාජ සංවර්ධනයෙහි ලා ඉලක්ක කොටගත් වඩාත් වැදගත් මෙන්ම, ඵලදායී විමර්ශනයක් වෙයි. ඒ අනුව මෙහි ප්‍රමුඛතම අද්‍යාශය වනුයේ සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලියට අදාළව උක්ත ශක්‍යතාවන්ගේ සන්නිවේදනමය දායකත්වය ගැඹුරින් විමසාබැලීම යි.

කාලානුරූපව ගොඩනැගුණු සාහිත්‍යය පරිශීලනය මෙහි ප්‍රමුඛතම ක්‍රමවේදය ලෙස ගැනේ ගුවන්විදුලිය මාධ්‍යයේ ඉතිහාසයට අදාළ මුද්‍රිතමාධ්‍යය එහිදී ප්‍රමුඛ වෙයි. ඒ සමගම සංවර්ධන විෂයක්ෂේත්‍රයට අදාළ විවිධ ගුවන්විදුලි වැඩසටහන් අධ්‍යයනය කිරීමෙන් එහි ශක්‍යතා හඳුනාගැනීම ද උක්ත ක්‍රමවේදයට ඇතුළත්කොට ගැණිනි. ගුවන්විදුලිය වූ කලී සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලියෙහි ලා පුළුල් ශක්‍යතා සහිත මාධ්‍යයක් බව මෙහිදී නිගමනය කෙරේ. ක්ෂණිකත්වය, බහුලීකරණය, සමාජ ප්‍රභේදතා සමතික්‍රමණය, නම්‍යශීලී සරල තාක්ෂණය, පරිකල්පනය පුළුල් කළ හැකිවීම, සාපේක්ෂ ලාභදායී බව හා විචිත්‍රාංගමය සන්නිවේදන රටාව ද මේ [illegible]හි ලා ප්‍රමුඛ වෙයි ඒ අනුව 'සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලියෙහි ලා වැඩි වශයෙන්ම භාවිත කොටගත හැකි මාධ්‍යය ගුවන්විදුලිය යි' යන්න මෙම අධ්‍යනයෙන් හෙළිදරව් කෙරෙන සුවිශේෂතම නිගමනයයි.

## හැඳින්වීම

ගුවන්විදුලිය ශත වර්ෂයකට ආසන්න දිගුකාලීන ඉතිහාසයක් සහිත ප්‍රකට විද්‍යුත් මාධ්‍යයකි. ලොව බොහෝ රටවල එය ජනප්‍රියතම ජනමාධ්‍ය ගොන්නෙහි එක් මාධ්‍යයක් ලෙස පැවතිය ද, මේ වන විට සිදුවෙමින් පවත්නා විවිධ සමාජ ආර්ථික හා දේශපාලනික මෙන්ම තාක්ෂණ විචල්‍යතා විසින් එහි උච්චාවචනයන් පෙන්නුම් කරයි. ගුවන්විදුලිය වූ කලී හඬ පමණක් මුල් කොටගත් ශ්‍රැතගෝචර සන්නිවේදන මාධ්‍යයක් වීම ඊට මූලික හේතුවයි. ඕනෑම සන්නිවේදන මාධ්‍යයක් ජන අවධානයට ලක් කෙරෙනුයේ ද, එකී මාධ්‍යයෙන් විසරණය කෙරෙන සංදේශයන් ජනගත කෙරෙනුයේ ද, සමාජ ප්‍රගමනයෙහි හෝ අවගමනයෙහි ලා ඒවා බලපැවැත්වෙනුයේ ද විවිධ පසුබිම් කාරණා රැසක් පදනම් කොටගෙන ය. මාධ්‍යයෙහි ප්‍රබලත්වය, කාලීන බව, අදාළ ජන කොට්ඨාසයෙහි විසද්ඥදණාමය ස්වරූපය හා උපයෝගිතාව ආදිය ඒ සඳහා වෙසෙසින් පදනම් වෙයි. නූතන රූප මාධ්‍යයේ තාක්ෂණමය හාස්කම් ලොව පහළ වන්නේ මේ අතරතුරදී යි මුලින් තිබූ ශ්‍රව්‍යගෝචර ස්වරූපය වෙනුවට පසුකාලීනව එය ශ්‍රව්‍යදෘශ්‍ය ස්වරූපයක් වූයේ ඒ බැවිනි. කණින් අසා සිත පිනවාගත් ශ්‍රාවකයෝ, ඇසින් බලා පංචේන්ද්‍රියම පිනවාගත හැකි ප්‍රේක්ෂකයින් බවට පත්වූයේ ඒ අනුව යි.

එසේනම් එබඳු තාක්ෂණ විචල්‍යතාවක් මධ්‍යයේ ගුවන්විදුලිය බඳු ශ්‍රව්‍ය මාධ්‍යයක් සංවර්ධන සන්නිවේදන ක්‍රියාවලියෙහි ලා භාවිත කළ හැක්කේ කෙබඳු ප්‍රබලතාවක් පදනම් කොටගෙන ද යන්න ගැඹුරින් විමසා බැලිය යුත්තකි. මෙම අධ්‍යයනයෙහි ප්‍රමුඛතම අධ්‍යාශය වනුයේ එකී ප්‍රබලතා විමසුමට ලක්කිරීමයි.

**ක්‍රමවේදය**

ගුවන්විදුලිය මාධ්‍යයට අදාළ න්‍යායයික හා ප්‍රායෝගික ස්වරූපයන් මෙහිදී විමර්ශනය කළ යුතුය. එබැවින්, ඊට අදාළව ගොඩනැගුණු මුද්‍රිත සාහිත්‍ය පරිශීලනයත්, කාලානුරූපව ගොඩනැගුණු, විවිධ සමාජඵල විමසීමත් ප්‍රමුඛ ක්‍රමවේදයක් ලෙස මෙහිදී අනුගමනය කොට ඇත. ජනමාධ්‍ය අධ්‍යයනයෙහි වෙසෙසින්ම පදනම් කොටගැනෙන යම් යම් සමාජමය සිද්ධිදාමයන් වැදගත් දත්ත ලෙස සලකා බැලෙනුයේ එබැවිනි.

**සාකච්ඡාව**

නූතන රූපමාධ්‍ය තාක්ෂණය (Modern Visual Media Technology) අද ලෝකය පුරා අතිශය ප්‍රචලිත ලෙස ව්‍යාප්ත වූ වඩාත් බලපෑම් සහගත ම ජනමාධ්‍ය ප්‍රවණතාව බවට පත් ව ඇත. සැතපුම් දහස් ගණනකට ඔබ්බෙන් වූ සිද්ධිමය වාර්තාකරණයක් එකෙනෙහි ම සජීව ලෙස ග්‍රාහකයා වෙත සමීප කරවන්නට තරම් වූ අතිශය සියුම් මාධ්‍යමය තාක්ෂණ ප්‍රබලතා මෙහිදී කැපී පෙණේ. හඬ පමණක් දෙසවනට ප්‍රවේශ කරවන සරල ශ්‍රැතගෝචර සන්නිවේදනය (Auditory Communication) වෙනුවට සමස්ත පංචේන්ද්‍රිය ම ග්‍රහණය කොටගත හැකි රූපමය සන්නිවේදනය (Visual Communication) අද වඩාත් ප්‍රබල වී ඇත්තේ එබැවිනි.

එහෙයින් ම, හඬ හෙවත් ශබ්දයට පමණක් සීමා වූ සන්නිවේදන ක්‍රමෝපායයන් ක්‍රමයෙන් නූතන මානව සමාජයෙන් ඈත්වන්නට ත්, ඒ කෙරෙහි පවත්නා ජන අවධානය ශීඝ්‍රාකාරයෙන් ක්ෂය වන්නට ත් පටන්ගෙන ඇති බව සමහරු අදහස් පළ කරති. නමුත්, සමස්ත මානව සමාජයේ ඉදිරිගමන තීරණය කරනු ලබන සංවර්ධනාත්මක සන්නිවේදනයෙහි ලා ඉන් පළකෙරෙන ශක්‍යතාව සරල ව හෝ විමසාබැලීම අත්‍යවශ්‍ය වෙයි.

වඩාත් දියුණු තාක්ෂණ සමාජයකට අදාළ ව, එහි එක්තරා සත්‍යතාවක් ප්‍රකට වුව ද දියුණු වෙමින් පවත්නා තුන්වෙනි ලෝකයේ රටවලට සාපේක්ෂ ව නම් එය හුදෙක් කල්පිතයක් පමණක් ම වනු ඇතැයි යන්න අපගේ හැඟීම යි. ඒ අනුව, දියුණුවෙමින් පවත්නා සමාජ, ආර්ථික හා දේශපාලන පසුතලයන්ට අනුව, ශබ්ද විකාශන ක්‍රමවේද (Strategies of Sound Broadcasting) මුල් කොටගත් ගුවන්විදුලිය මාධ්‍ය (Radio Media) පිළිබඳ නව දැක්මක් හා දර්ශනයක් සහිත නව අවධානයක් යොමු කළ යුතු ව ඇත. එහි ඓතිහාසික ශක්‍යතා නූතන සමාජ අවශ්‍යතාවනට අනුකූල ලෙස මුවහත් කරගැනීමෙන් එය සිදුකළ යුතුව ඇත.

ලෝකයේ විවිධ රටවල ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ක්‍රියාදාමයට හවුල් වී සිටින මාධ්‍යයෝ රැසක් වෙති. ඒ අතර ගුවන්විදුලිය මාධ්‍යයට හිමිවන තැන කෙබඳු ද? එකී තත්ත්වයන් කෙරෙහි ලා සෘජුව ම බලපාන ගුවන්විදුලිය මාධ්‍ය සුවිශේෂතා හෙවත් ප්‍රබලතා, ඌනතා මෙන්ම සීමාවන් ද මෙහිදී විමසා බැලිය යුතු ය. ඒ මන්දයත්, අප සාකච්ඡා කරන සංවර්ධන ක්‍රියාදාමය ත්, ගුවන්විදුලිය ත් අතර අන්තර්ක්‍රියාවලින් තීරණය කෙරෙනුයේ එකී ප්‍රබලතා, ඌනතා හෝ සීමාවන් පදනම් කොට ගෙන බැවිනි.

ගුවන්විදුලියට ම සුවිශේෂ වූ මාධ්‍යමය ශක්‍යතාවන් පිළිබඳ විවාදයක් නැත. එහි පවත්නා සෘජු බව හා ක්ෂණික බව මෙන් ම සරල බව ද විසින් එකී මාධ්‍යය සමස්ත ග්‍රාහක සමූහයා වෙත දක්වන සමීපස්ථ බව පසක් කරවනු ලබයි. මාර්ෂල් මැක්ලූහන් වැනි ප්‍රකට සන්නිවේදන විද්‍යාඥයින් පෙන්වාදුන් විශ්ව ගම්මාන සංකල්පයේ පදනම සකස් කළ මූල සාධක මෙහි අන්තර්ගත වන බැව් ඉඳුරාම කිව හැකි ය. එනම්, තොරතුරු සම්පාදනය වූ කලී ගුවන්විදුලියේ මූලික අරමුණු වලින් එකක් වීම යි.

මෙකී සංකල්පය සම්පූර්ණයෙන් ම නිවැරදි වුවත්, නොවුවත් මීට වැඩි ලෙස පාදක වනුයේ දියුණු චන්ද්‍රිකා පණිවුඩ තාක්ෂණය ත්, ඒ හා සම්බන්ධිත රූපවාහිනී කාර්යභාරය ත් බැව් පැහැදිලි ය. නමුත් තුන්වන ලෝකයේ දියුණුවෙමින් පවත්නා රටවල නොදියුණු ප්‍රාදේශීය තත්ත්වයන් යටතේ වඩාත් වැදගත් වූ ත්, විශිෂ්ට වූ ත් කාර්යභාරය දරා සිටින්නා වූ මාධ්‍යය ගුවන්විදුලිය යි. අප කතාකරන අද්‍යතනයේ පවා එවැනි රටවල් තුළ ගුවන්විදුලිය මාධ්‍යය විසින් කරනු ලබන මෙහෙවර අද්විතීය බැව් විවිධ අධ්‍යයනයන්ගෙන් හෙළිවන කරුණකි. තොරතුරු සම්පාදකයකු හා අධ්‍යාපන කාරකයකු ලෙස ක්‍රියාත්මකවීම මෙන්ම පෙළඹවීම්කාරකයකු හා විනෝදාස්වාද සම්පාදකයකු ලෙස ගුවන්විදුලිය මාධ්‍ය විසින් කරනු ලබන මෙහෙවර වූ කලී මෙහිදී අප විමසුමට පාදක කොට ගන්නා සංවර්ධන ක්‍රියාදාමය කෙරෙහි ලා බලපවත්නා මූල සාධකයෝ ය.

සංවර්ධන කාර්යය ඉදිරියට පවත්වාගෙන යාම අතින් ඉතා වැදගත් වන්නේ එයට සම්බන්ධ අදහස් විටින්විට කාර්ය සාධක පදනමක් මත ග්‍රාහකයා වෙතට සම්ප්‍රේෂණය කිරීම යි. අප මෙහිදී ප්‍රස්තුත කරගන්නා සංවර්ධනය වූ කලී ලෝකයේ බහුතර ග්‍රාමීය ප්‍රජාව හා කෙරෙන සම්බන්ධීකාරක ක්‍රියාවිශේෂයක් වෙයි එනම්, දියුණු වෙමින් පවත්නා රටවල වෙසෙන බහුතර ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමේ කාර්යය අදාළ වනුයේ එකී බහුතර ග්‍රාමීය ප්‍රජාවට ම නොවේ ද? අතිශය දියුණු විද්‍යුත් මාධ්‍යයක් වුව ද, සුළුතර වූ නාගරික ජනකොටසකට සීමාවූ රූපවාහිනියට පමණක්, අභිප්‍රේත සංවර්ධනය කරා අප ළඟාකරවිය හැකි ද?

තුන්වන ලෝකයේ රටවල මෙය සුවිශේෂ වැදගත්කමක් දරන ප්‍රශ්නයකි. බහුතරයක් වූ ග්‍රාමීය දිළිඳු ජනතාව හා අත්වැල් බැඳගන්නා මාධ්‍යයක අවශ්‍යතාව මෙහිදී කැළඹගැන්වෙයි. එනම් ඔවුන්ගේ උවමනා එපාකම් හා සම්පත් මෙන්ම හැකියාවන් ද අදාළ කොටගත හැකි මාධ්‍ය භාවිතයක අවශ්‍යතාව යි. ගුවන්විදුලිය මාධ්‍යයට වෙසස් තැන් හිමිවනුයේ මෙහිදී ය. තොරතුරු සම්පාදන චන්ද්‍රිකා, රූපවාහිනිය, සිනමාව මෙන්ම පුවත්පත ද ඉටුකරන කාර්යභාරය අතර ගුවන්විදුලියේ සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය විශිෂ්ට වනුයේ කෙලෙසක ද? ඒ කෙරෙහි ලා ඉදිරිපත් කළ හැකි සාක්ෂි හා සාධක අපමණ ය. විශ්වව්‍යාප්ත ගැමි ප්‍රජාව කේන්ද්‍ර කොටගෙන මේ වෙත අවධානය යොමුකිරීමේදී සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය උදෙසා ගුවන්විදුලිය මාධ්‍යයේ විද්‍යමාන පහසුකම් සහ ඒ හා සම්බන්ධ සමාජීය වැදගත්කම් ද අපි මෙහිදී විමසා බලමු [1,2].

මුලින් අප සඳහන් කළ සෘජුබව සහ ක්ෂණිකබව මෙහිදී කැපී පෙනෙන ගුණාංගය කි. විස්තීරණ ග්‍රාහක ක්ෂේත්‍රයක් කෙරෙහි එක්වරම පණිවුඩයක් නිකුත්කිරීමේ හැකියාව තුළ කැළඹගැන්වෙන බහුලීකරණ ශක්‍යතාව ද වැදගත් කොට සැලකිය යුතු ය. සංවර්ධන ක්‍රියාදාමය අතරතුර ප්‍රතිචාරකයා අතර ගොඩනැගිය යුතුව ඇති සාමූහිකත්වය පිළිබඳ සංකල්පයේදී මෙකී හැකියාව

කදිම පිටුවහලක් වන බව කිව හැකි ය. එනම්, වඩාත් පුළුල් ව ව්‍යාප්තවන්නාවූ තුන්වෙනි ලෝකයේ රටවල විශාලවපසරියකින් යුත් භූමි භාගයන් හා එහි ප්‍රජාව කෙරෙහි ක්ෂණික දැනුවත් කිරීම් තුලින් මෙකී කාර්යය ඉදිරියට රැගෙන යාමේ පහසුව යි. මාරාන්තික රෝග, වසංගත හා ක්ෂණික භෞතිකමය විපර්යාසයන්, හානිකර වූ දේශගුණික හා කාලගුණික තත්ත්වයන් පිළිබඳ කෙරෙන ක්ෂණික තොරතුරු සම්පාදනය නිදසුන් ය.

එපමණක් නොව, සාක්ෂරතාවයෙන් තොර ග්‍රාහක කොට්ඨාස කෙරෙහි ගුවන්විදුලිය මාධ්‍යය දක්වන සම්පස්ථභාවය විශිෂ්ට ය. එනම්, ගුවන්විදුලිය වූ කලී උගත් නූගත් භේදයකින් තොරව පහසුවෙන් ම ග්‍රහණය කොටගත හැකි පොදු මාධ්‍යය කි. අදාළ ග්‍රාහක කොට්ඨාසයේ අකුරු හැකියාව මෙහිදී වැදගත් කොට නොසැලකේ. මෙකී මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය උපයෝගී කරගන්නා සංවර්ධන කාර්යයට එකී ඌනතාව බාධාවක් නොවේ. මෙය ඉතා සරල කාරණයක් වන්නේ ඒ පිළිබඳ නිදර්ශන සුලබ බැවිනි.

මහාචාර්ය කේ එසී සීතාරාම් විසින් ඉන්දියානු ජන සමාජය ඇසුරෙන් පවත්වන ලද පර්යේෂණයන් හා එහි නිගමනයන් පිළිබඳ සලකා බැලීමේදී මෙය වඩාත් පැහැදිලි කෙරේ ඉන්දියානු ජන සමාජය වූ කලී සංවර්ධනය වෙමින් පවත්නා රටවල සමස්ත මානව වර්ගයා නියෝජනය කෙරෙන සමාජ කොට්ඨාසයක් යැයි සිතීම නිවැරදි යැයි හැඟේ. ඊට හේතුව සමස්ත ලෝකය තුළ ව්‍යාප්තව පවතින්නා වූ සමාජ, සංස්කෘතික හා දේශපාලනික ස්වරූපයන්හි සකලවිධ හැඩතල එහි නිරූපිත බැවිනි. ඒ නිසා ම ඒ සම්බන්ධ පර්යේෂණ හා නිගමන මුළුමහත් තුන්වන ලෝකයට ම පොදු වූවක් බැව් උපකල්පනය කිරීම අපහසු නැත. මහාචාර්ය සීතාරාම් ගේ පර්යේෂණ මඟින් අනාවරණය කළ හැකි වූ වැදගත් නිගමන දෙක කි[3].

1. ගැමි ජනතාව තුළ දැනුම හා අවබෝධය පුළුල් කරගැනීම සඳහා ඉවහල් වන ප්‍රමුඛතම නිවේදනාත්මක මාධ්‍යය ගුවන්විදුලිය බව.
2. දිගුකාලීන වශයෙන් ගුවන්විදුලියට සවන් දෙනු ලබන අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව නැති ග්‍රාහකයා තුළ, අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති එහෙත් ගුවන්විදුලියට සවන් නොදෙන පුද්ගලයන්ට වඩා කාලීන ප්‍රවෘත්ති පිළිබඳ ඇති අවබෝධය පුළුල් බව.

මෙයින් පැහැදිලි වන්නේ කුමක් ද? සංවර්ධන කාර්යය සඳහා අවශ්‍ය අවබෝධය සහ දැනුවත් බව සෙසු මාධ්‍යයන්ට වඩා ගුවන්විදුලිය මාධ්‍යය මඟින් වේගවත් ව මෙන්ම පුළුල්ව ද බහුතර සමාජ කොට්ඨාස අතර ව්‍යාප්ත කළ හැකි බව ය.

මෙම නිගමන පිළිගැනීමට අප වැඩි ඈතක යා යුතු නැති ශ්‍රී ලංකාවේ ම පිහිටුවා ඇති ප්‍රාදේශීය ගුවන්විදුලි මධ්‍යස්ථාන හා ඊට අනුබද්ධ ප්‍රජා ගුවන්විදුලි සේවාවන් මඟින් කුළුගන්වන පර්යේෂණ නිගමන ඊට ප්‍රමාණවත් සාක්ෂි සපයයි. ශ්‍රී ලංකා ගුවන්විදුලියේ රජරට, රුහුණ හා මහනුවර සේවාවනුත්, ඊට අනුබද්ධ කොත්මලේ හා ගිරාඳුරුකෝට්ටේ ඇතුළු ප්‍රජා ගුවන්විදුලි සංවර්ධන සන්නිවේදන ක්‍රමෝපායයන් ඒ අතර කැපී පෙනෙයි[4]. රටවල් 24 කින් යුක්තව තිබූ ආසියා ශාන්තිකර ගුවන්විදුලි සංගමයේ ප්‍රධාන ලේකම්ව සිටි ශ්‍රීමත් චාල්ස් මෝසස් ගේ ප්‍රකාශයක් අපගේ නිගමන හා සසඳා බලමු. සමහර ආසියාතික රටවල ජනගහනයෙන් 70% කට පමණ අක්ෂර ඥානයක් නොමැත. මෙම ලක්ෂ සංඛ්‍යාත ජනකාය ස්වභාෂාවෙන් ම කෙරෙන ගුවන්විදුලි ප්‍රචාර හැරුණු විට සෙසු මාධ්‍යවලින් ඈත් වී සිටිති. සංවර්ධනය වෙමින් පවත්නා රටවල සැබෑ ආර්ථික හා සාමාජීය ප්‍රගතිය ඇතිකිරීම සඳහා ඒ රටවල මුළුමහත් ප්‍රජාවම සම්බන්ධ කරවා ගැනීම අවශ්‍ය බව පිළිගනිමු නම් ඒ සඳහා විවර ව ඇති එක ම මාධ්‍යය ගුවන්විදුලියයි[2].

මාධ්‍ය භාවිතය සඳහා ග්‍රාහකයාට විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවීම ද මීට ම සම්බන්ධ හේතුකාරකය කි. එය වඩාත් සරල ය. මාධ්‍යය ඇසුරු කිරීම උදෙසා ඇවැසි සුදුසුකම් සරල හා ලිහිල් වූ තරමට ම ඒ සඳහා වන ග්‍රාහක සහභාගිත්වය හා ඵලදායි බව ප්‍රශස්ත වීම ප්‍රායෝගික සත්‍යය කි.

ඕනෑම සමාජ කොට්ඨාසයක ආර්ථික හැකියාව හෝ නොහැකියාව මත සැකසුණු ගුවන් විදුලි යන්ත්‍රය හා සම්බන්ධ අඩුමිල ක්‍රමය, කාලීන සමාජ ආර්ථික රටාවනට කෙතරම් දුරට ගැලපේ ද? එය ග්‍රාහකයා ලබන විශිෂ්ට පහසුකමක් නොවේ ද? වෙනත් ජනමාධ්‍යයක් ඇසුරු කිරීම සඳහා දෛනික ව වැය කළ යුතු මුදල වෙනුවට හෝ එකවර වැය කළ යුතු ධනස්කන්ධයක් වෙනුවට අඩුමිලට ලබාගත් කුඩා ගුවන්විදුලි යන්ත්‍රයකින් ඔවුන් ලබන ප්‍රතිලාභය කොපමණ ද? එය කිරා, මැන තක්සේරු කිරීම උකහටයැයි සිතමි.

තුන්වන ලෝකයේ නොදියුණු රටවල් අතර අද වනවිට භාවිත කෙරෙන ගුවන්විදුලි යන්ත්‍ර ප්‍රමාණය, රූපවාහිනී යන්ත්‍ර ප්‍රමාණය මෙන් දස ගුණයකි නිදසුන් ලෙස, 1992 වර්ෂයේ ශ්‍රී ලංකාවේ භාවිත රූපවාහිනී යන්ත්‍ර ප්‍රමාණය 850,000 (අට ලක්ෂ පනස් දහසක්) වුවත් බලපත් සහිත ගුවන්විදුලි යන්ත්‍ර ප්‍රමාණය පමණක් විසිපන් ලක්ෂ හැටහය දහසකි[5] රූපවාහිනී යන්ත්‍රයට වඩා බලපත් රහිත ගුවන්විදුලි යන්ත්‍ර ලක්ෂ ගණනක් දැනුදු භාවිත කරන බැව් පර්යේෂණ වලින් හෙළිවෙයි. එසේනම් අප මුලින් කී තුන්වෙනි ලෝකයේ ගුවන්විදුලි හා රූපවාහිනී යන්ත්‍ර ප්‍රමාණය වූ 10:1 අනුපාතය අපටත් වලංගු වේ. එබැවින් ගුවන්විදුලිය මෙහි ප්‍රමුඛතම සංවර්ධන සන්නිවේදන කාරකයා විය නොහැකි ද?

මෙහි විශේෂත්වය කුමක් ද? රටක සංවර්ධන කාර්යයට පදනම් වන ග්‍රාහක ක්ෂේත්‍රය වූ කලී බොහෝවිට එරට සිටින ග්‍රාමීය ප්‍රජාව යි. එහෙයින් ම, හුදෙක් සුළුතරයක් වූ නාගරිකයා අතර පරිහරණය කෙරෙන රූපවාහිනියකට හෝ පුවත්පතකට හෝ වෙනයම් ජනමාධ්‍යයකට වඩා වැඩි බලපෑම්, බහුතරයක් වූ ගැමියා අතර පරිහරණය කෙරෙන ගුවන්විදුලිය මගින් සිදුකෙරෙන බව අවිවාදයෙන් පිළිගත යුතු ය.

රටක සංවර්ධන ක්‍රියාදාමය කෙරෙහි ලා ගුවන්විදුලිය මාධ්‍යය මහෝපකාරී වීමට බලපාන තවත් ඉතා වැදගත් සාධකයක් වෙයි. එනම්, මාධ්‍යය ත්, ග්‍රාහකයා ත් අතර ගොඩනැගෙන ප්‍රශස්ත වූ සමීප සම්බන්ධතාව යි. වෙනත් කිසිදු ජනමාධ්‍යයකට වඩා වැඩි ශක්‍යතාවක් මෙහිදී මෙකී මාධ්‍යය විසින් පසක් කරවනු ලබයි. ජනතා සහභාගීත්වයක් නැති අධිපතිවාදී නිවේදනාත්මක මාධ්‍යයන්ගෙන් නිකුත් කළ නිලනිවේදන පිළිබඳ සැලකිල්ලක් නොදැක්වූ ග්‍රාහකයා, අද තමන් සමීපයට පැමිණ ඇති මාධ්‍ය සහකරුවා පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි. ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන ක්‍රියාදාමයක් ව්‍යාප්ත කිරීමේදී හැකිතාක් දුරට ජනතාව සහභාගි කරවා ගත යුතු ය. මේ මගින් ජනතා විශ්වාසය ගොඩනැගීම ත් සමගම ඔවුන් සතු ප්‍රායෝගික දැනුම, සිය බුද්ධිය හා සැඟවුණු කුසලතාව ආදිය එළිදැක්වීමට ඉඩ ප්‍රස්ථාව සැකසේ. ඒ තුළින් සිදුවන්නේ කුමක් ද? පාරම්පරික ව ඔවුන් තුළ පවතින මිථ්‍යා විශ්වාස හා සම්ප්‍රදායයික අදහස් ආදිය එකී සංවර්ධන ක්‍රියාදාමයට උචිත වන පරිදි වෙනස් කරගැනීමට හැකියාව ලැබීම යි.

ග්‍රාහක කේන්ද්‍රීය සහභාගිත්ව සන්නිවේදන ක්‍රමෝපායයක[6] අවශ්‍යතාව මතුවන්නේ මෙහිදී ය.

මේ වනවිට අතිසාර්ථක ලෙස චීනය ඇතුළු රටවල් කිහිපයක ම ක්‍රියාත්මක කෙරෙන ගුවන්විදුලි සංවර්ධන ආකෘතිය මීට මනා නිදසුන කි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කෙරෙන ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවන් මෙහිදී ඉටුකරනුයේ සුවිශේෂ කාර්යභාරය කි. ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවක් (Regional Network) අදාළ භූගෝලීය හා සමාජ පරිසරයට ගැලපෙන ලෙස සිය සංවර්ධනමය කටයුතු ප්‍රමුඛත්වයෙහි ලා සලකයි[7]. එයට විශේෂ වනුයේ එකී දේශයේ ජනතාවගේ අදහස, උදහස්, පරමාර්ථ, අරමුණු හා ඊට බැඳී පවතින පරිසරය යි.

ප්‍රජා ගුවන්විදුලි සේවාවකින් (Community Radio) ඉටුකෙරෙන මෙහෙය ද මීට සමානුපාතික වුව ද[8], එකී අරමුණු හා ක්‍රියාකලාපයන් වෙසෙස් ස්වරූපයක් ගනී. පැහැදිලිව ම අදාළ ශ්‍රවණ කලාපය තුළ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම මෙහි මූලික ම අධ්‍යාශය යි.

අදාළ ජනතාවගේ සිතුම් පැතුම්, ආකල්ප හා සමාජ තත්ත්වයන් හඳුනාගෙන වැඩසටහන් ඉදිරිපත් කිරීම තුළින් වඩාත් පහසුවෙන් මෙහි අභිප්‍රේතාර්ථ සාධනය වෙයි. මෙහිදී පණිවුඩ ඉදිරිපත් කිරීම තුළින් වඩාත් පහසුවෙන් සාමූහික සාකච්ඡා ඇතිකිරීම හා ප්‍රායෝගික සහභාගීත්ව වැඩසටහන්, ක්‍රමරටාවක් ඔස්සේ ක්‍රියාත්මක කරවීමත් පසු විමසුම් කාර්යය ඉටුකිරීමත් සිදුවෙයි එසේ නොවේ නම්, ග්‍රාමීය ප්‍රජාව අතර චර්යාවෙහි හෝ ආකල්පයෙහි වෙනස්කම් ඇති කිරීම වඩාත් දුෂ්කර ය.

අග්නිදිග ආසියානු කලාපය ප්‍රමුඛත්වයෙහි ලා සලකමින් 1984 දී නේපාලයේ කරනු ලැබූ පර්යේෂණ කිහිපයකින් ම හෙළි කෙරුණේ ප්‍රජා සහභාගීත්වයකින් තොරව සංවර්ධන සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක ව දියත් කළ නොහැකි බවයි[9]. කෘෂි ගුවන්විදුලිය (Farm Broadcasting) ඊට කදිම විසඳුමක් ලෙස සලකන පර්යේෂකයෝ විවිධ මංපෙත් ඔස්සේ එහි ඵලදායි බව සනාථ කරති. නේපාලය ප්‍රමුඛ අග්නිදිග ආසියානු කලාපීය ගොවි ජනතාවට කෘෂි තොරතුරු හා ඊට අදාළ අවබෝධය ලබාදීම තුළින් ඔවුන්ගේ ප්‍රශ්නවලට මැදිහත්වීමට ත්, මාධ්‍යය පිළිබඳ විශ්වාසනීයත්වයක් ගොඩනැංවීමට ත් ගුවන්විදුලියට ඇති හැකියාව ඒ මගින් ප්‍රායෝගික ව ස්ඵුට කොට ඇත.

එස්කැප් (ESCAP) සංවිධානය මගින් දැනට දියත් කරනු ලබන ප්‍රාදේශීය සහයෝගිතා කෘෂි ගුවන්විදුලි ව්‍යාපෘති. (Regional Co-operation in Project of Farm Broadcasting) රාශියක් පිළිබඳ වූ වාර්තාවකින් ද[10] මේ පිළිබඳ අවශ්‍ය කරුණු දැක්විය හැකි ය. සංවර්ධන ක්‍රියාවලියේදී ගුවන්විදුලිය දක්වන ප්‍රායෝගික ශක්‍යතාව ප්‍රකට කළ මෙම ව්‍යාපෘතිය කොටස් දෙකකට බෙදිනි.

I. ආසියානු කලාපීය ව්‍යාපෘතිය (ශ්‍රී ලංකාව, ඉන්දියාව, තායිලන්තය, කොරියාව, පිලිපීනය, බංග්ලාදේශය, වියට්නාමය, ඉන්දුනීසියාව, නේපාලය, චීනය, ජපානය, පකිස්තානය සහ ඕස්ට්‍රේලියාව යන රටවල් මීට අයත් ය.)

II. ශාන්තිකර කලාපීය ව්‍යාපෘතිය (සොලමන් දූපත ප්‍රධාන කොටගත් රටවල් රාශියක් තුළ)

1988 නොවැම්බර් 2 වැනිදා බැංකොක්හිදී පවත්වන ලද කෘෂි ගුවන්විදුලිය පිළිබඳ සැසිවාරයක වාර්තා හා ලිපි ලේඛන මීට පදනම් කොටගැනේ. ඒ ඒ රටවලට උචිත සංවර්ධන ක්‍රියාදාමයක් උදෙසා මහෝපකාරී විය හැකි පරිදි ගුවන්විදුලිය මගින් බහුතර ග්‍රාමීය ප්‍රජාවට අවශ්‍ය අවබෝධය ලබාදීමට, උපදේශකත්වය, සංවිධානය, සැලසුම්කිරීම, සහභාගීත්වය, ජනමාධ්‍ය පරිහරණය හා ඵලදායීතා ඇගයීම වැනි විෂයයන් කෙරෙහි මෙහිදී දැඩි අවධානය යොමුකොට තිබිණි. ග්‍රාහක සහභාගීත්වය කේන්ද්‍රකොටගත් ගුවන්විදුලි ක්‍රමවේදයක විශිෂ්ට ඵලදායිතාව මේ මගින් කුළු ගැන්වුණු ප්‍රමුඛතම නිගමනය යි.

යථාරූපී සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාමාර්ග කෙරේ ග්‍රාහකයා පොළඹවා ගැනීම කෙරෙහිලා වඩාත් වැදගත් වන්නේ පුද්ගලාන්තර සන්නිවේදන ක්‍රියාවලිය යි (Inter-personal Communication). අප මෙහිදී සලකා බලන ප්‍රජාගුවන්විදුලිය තුළ මේ කෙරෙහි ලා සැලසෙන ඉඩකඩ අපමණ ය. එහි අපේක්ෂිත අරමුණු විසින් ම එකී කාරණය සනාථ කරයි.

i. ඔවුන්ට අවශ්‍ය අධ්‍යාපනය හා ධෛර්යය ලබාදීම
(Educate and encourage them)
ii. ඔවුන් සතු දක්ෂතා වර්ධනය කරගැනීමට සහායවීම
(Help them to develop their talents)
iii. ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමට සහාය වීම
(Help to improve the quality of life of the community)
iv. මාධ්‍යය සහ ප්‍රජාව අතර විශ්වාසය ගොඩනැගීම
(Build up credibility among media and community)
v. සංස්කෘතික උරුමයන් රැකගැනීමට හා වර්ධනය කරගැනීමට ඔවුන්ට සහයවීම
(Help them to promote and preserve their cultural heritages)
vi. ප්‍රජාව අතර සාමය, සාමදානය, සමඟිය හා සාමූහිකත්වය තර කරගැනීමට සහයවීම
(Help to developing peace, order, harmony and solidarity among the people)

පුද්ගලාන්තර සන්නිවේදනය ගුරුකොටගත් සාමූහික සාකච්ඡාමය වැඩසටහන් මගින් කෙරෙන පෙළඹවීමේ හා ප්‍රජානනීය හැකියාව (Ability of motivation and perception) මෙහිදී වඩාත් වැදගත් වේ. සංවර්ධනාත්මක සන්නිවේදනයේ හුදු සිද්ධාන්තමය නියායන් හෝ වාචික රීතීන් වෙනුවට ඒවායේ ප්‍රායෝගික ක්‍රියාත්මක ස්වරූපය ප්‍රජා ගුවන්විදුලියේ භාවිතය විවිධ ක්‍රමෝපායයන් ඔස්සේ සිදුකෙරෙයි[11].

| | |
|---|---|
| විවෘත ගුවන්විදුලිය | (Open Broadcasting) |
| උපදේශාත්මක ගුවන්විදුලිය | (Instructional Broadcasting) |
| ගුවන්විදුලි කෘෂි සාකච්ඡා | (Agricultural Discussion) |
| අනුකරණ ගුවන්විදුලිය | (Radio Animation) |
| ගුවන්විදුලි පාසල් | (Broadcasting School) |
| ගුවන්විදුලි නාට්‍යවේදය | (Strategy of Radio Drama) |

මාධ්‍යයේ ප්‍රමුඛත්වයත් සමඟම පුද්ගලාන්තර සන්නිවේදනය ඇඳගත් ක්‍රියාකාරී සහභාගීත්වය, අභිප්‍රේරණාත්මක සම්පස්ථභාවය සහ ගැමියාට හුරු මානසික ප්‍රවේශය යන විශිෂ්ටතා මෙහිදී වඩාත් කුළුගැන්වෙයි. ඒ අතර ම මාධ්‍යය සතු සරල බව තුළින් දැක්වෙන තාක්ෂණික සුඛනම්‍යභාවය ද මෙහිදී මහඟු පිටිවහලක් වෙයි. එනම්, බාහිර පටිගතකිරීම් (Out Broadcasting) සහ සජීව ප්‍රචාරයන් (Live Broadcasting) උපයෝගී කොටගෙන සංවර්ධන පණිවුඩ හා ක්‍රියාමාර්ග ප්‍රජාගත කිරීමේදී දක්වන ශක්‍යතාව සහ කාලීන වශයෙන් වැදගත් ක්ෂණික වැඩසටහන් සම්පාදනය කිරීමේ ඇති හැකියාව යි. තුන්වෙනි ලෝකයේ දිළිඳු රටවලට මෙකී ක්‍රමවේදයන් වඩාත් වැදගත් වනු ඇත.

වෙනත් මාධ්‍යයක් හා මෙකී ක්‍රමවේදයන් ගලපාගැනීම වඩාත් සංකීර්ණ මෙන්ම අතිශය දුෂ්කර කටයුතු කාර්යය කි. ඒ හැර

වියදම්, නඩත්තු, පාලනය, සංවිධානය, කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම්, වෙනස් කිරීම් හා ඒ ඒ සමාජවලට ගලපා ගැනීම් වැනි කටයුතුවලදී දැක්වෙන සරල බව ද සෙසු මාධ්‍යවලට සාපේක්ෂ ව වඩාත් වාසි සහගත ය.

එපමණක් නොව, මූලික නිවේදනාත්මක ස්වරූපය වෙනුවට භාවිත කළ හැකි සංගීතමය, සංවාදමය හා නාට්‍යමය තත්ත්වයන් එක්කොටගත් විචිත්‍රාංගමය වැඩසටහන් සැකසීම ඇති හැකියාව ද මෙහි ප්‍රබලත්වය ප්‍රතිරූපණය කරයි.

සාමාන්‍ය දේශනයකට සවන්දීමට වඩා සංගීතයට නාට්‍යකට හෝ විචිත්‍රාංගයකට ඇලුම් කිරීම ග්‍රාහක ස්වරූපය තුළ දැක්වෙන පොදු විශේෂතාව කි. විලියම් ස්ටීවන්සන් විසින් හඳුන්වා දෙන ලද සන්නිවේදනයේ විනෝදාස්වාදන සම්පාදන ක්‍රමෝපායි (The Play Theory of Communication)මෙහිදී පදනම් වෙයි[8]. සරල විනෝදාස්වාදය අගය කරන බහුතර ගැමි ජනතාව ජනමාධ්‍යය කෙරෙහි යොමුකරවා ගැනීමට මෙකී ක්‍රමවේදය මහෝපකාරී වෙයි. අනතුරුව මාධ්‍ය තුළින් ලබන අවබෝධය, සිය ජීවිත අත්දැකීම් කොට ගනිමින් අභ්‍යන්තරයෙන් ම නව ප්‍රබෝධයක් ඇතිකොට යථාවබෝධය පසක් කරනුයේ මෙතැනදී ය.

**නිගමනය**

ගුවන්විදුලිය මාධ්‍යය වූ කලී සංවර්ධනාත්මක සන්නිවේදනයෙහි ලා ඵලදායී ලෙස භාවිත කළ හැකි ශක්‍යතා රැසක් සහිත මාධ්‍යයක් වෙයි. මාධ්‍යමය මූලධර්මීය තත්ත්වයන්ට අනුවත්, භෞතිකමය භාවිතයන්ට අනුවත් සලකාබලන කල ඒවා වඩාත් වාසිසහගත සාධනීයතා ලෙස හඳුනාගත හැකි ය. පොදු ගුවන්විදුලිය තුළින් මෙන්ම සෙසු සියලු ගුවන්විදුලි ක්‍රමවේදයන් තුළින් ද ඒ බව ඔප්පු කෙරේ.

මේ අනුව, නිශ්චිත ශ්‍රවණ කලාපයක් තුළ වන ප්‍රජාවගේ අදහස් උදහස්, අරමුණු, චර්යාවන්, භාෂාමය හා සදාචාරමය තත්ත්වයන් ද සැලකිල්ලට ගැනීමට ප්‍රාදේශීය හෝ ප්‍රජා ගුවන්විදුලියට ඇති හැකියාව අනල්ප ය. මේ සියල්ල තුළ පිළිබිඹු කෙරෙනුයේ අදාළ ශ්‍රවණ කලාපීය ග්‍රාහකයාගේ විශද්සදාණමය තත්ත්වය ත්, හාත්පස භෞතික ස්වභාවය ත් ය. මෙකී අංශද්වය පිළිබඳ මාධ්‍යකරුවා ලැබිය යුතු අවබෝධය වඩාත් සුවිශේෂ වූ අත්‍යවශ්‍ය සාධකයකි. ප්‍රාදේශීය හෝ ප්‍රජා ගුවන්විදුලියක් ඊට ගෝචර වන මංපෙත් හෙළිපෙහෙළි කරයි. විචාර බුද්ධියෙන් තොරව අරුත් සුන් සාම්ප්‍රදායිකත්වයෙහි ම පමණක් ඇලී ගැලී සිටින සමහර ගැමි ජන කොට්ඨාසයන්හි විශද්සදාණය ජයගන්නට මාධ්‍ය කරුවාට හැකිවනුයේ මෙකී ස්ථාවරය මත ය. සංවර්ධනාත්මක සන්නිවේදනය කෙරෙහි ලා ගුවන්විදුලිය මාධ්‍යයේ අභිප්‍රේත සාධන කාර්යය ඒ තුළින් ඉටු කෙරෙන බැව් අවධාරණය කළ හැකි ය.

**ආශ්‍රිත කෘති**


1. Keating R. Grass Root Radio: A manual for field workers in family planning and other areas of Social and Economic development. London: University Press, 1977.

2. Misra L.K. Communicating through Radio: A hand book. Rome: FAO, 1986. 3. කරුණානායක එන්. ගුවන්විදුලිය සහ සංවර්ධනයෙහි ලා එහි කාර්යභාරය. සංවර්ධන ගුවන්විදුලි ශිල්පය. කොළඹ: ගුවන්විදුලි සංස්ථාව, 1986, 4.

4. Compendium of Audience Research: (1982 – 1988), Colombo: S.L.B.C.

5. සමාජ ආර්ථික දත්ත සටහන, කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව, 1992.

6. නානායක්කාර එස්. සංවර්ධනාත්මක සන්නිවේදනය, තෙවන මුද්‍රණය, කොළඹ : එස් ගොඩගේ සහෝදරයෝ, 2012: 110-112.

7. Bittner J R. Mass Communication and Introduction. 4th ed, New Jersey: Prentice Hall, 1986.

8. Watson J, Hill A. A dictionary of Mass Communication and Media Studies. New Delhi: Universal Book Stall, 1989.

9. Farm Broadcasting in Nepal: An evaluation of the Farm Broadcasting. Rome: FAO , 1983.

10. Farm Broadcasting in Asia and the Pacific Region, New York: ESCAP,1989.

11. මේදිස් පී. ගුවන්විදුලියයි ප්‍රජා සංවර්ධනයයි. කොළඹ: ශ්‍රී ලංකා පදනම් ආයතනය, 1985, 10-28.